## මෙම පෙති භාවිතයේදී වැදගත් වන කරුණු

- මෙම පෙති ගැනීමට පෙර කුමන හෝ ආහාරයක් ගැනීම (එනම් නිරාහාරව පෙති නොගැනීම)

- මෙම පෙති භාවිතයෙන් පසු නැවත සිදුවන අනාරක්ෂිත ලිංගික එක්වීම් සඳහා මෙයින් ආරක්ෂාවක් නොලැබේ

- පෙති ගැනීමෙන් අනතුරුව එම කාන්තාව ගැබ් ගතහොත් මෙම පෙති ගැනීම නිසා දරු ගැබට හානියක් සිදු නොවේ

- ගැබ් ගත් කාන්තාවක් හදිසි පවුල් සැලසුම් පෙති භාවිතා කිරීම නිසා ඇයට ගබ්සාවක් සිදු නොවේ

- මෙම පෙති  භාවිතා කිරීමෙන් පසු පළමු මාසික ඔසප් වීම සාමාන්‍ය අන්දමට හෝ නියමිත දිනට දින කිහිපයකට පෙර හෝ පසුව සිදුවිය හැකිය

- එහෙත් මාසික ඔසප්වීම සතියකට වඩා ප්‍රමාද වුවහොත් හෝ ඒ පිළිබඳව කිසියම් ගැටළුවක් ඇත්නම් හෝ වෛද්‍ය උපදෙස් ලබා ගන්න



හදිසි පවුල් සැලසුම් ක්‍රමයක් වශයෙන් අන්තඃ ගර්භාෂ තැන්පතුව භාවිතා කළ හැකිය. ඒ සඳහා සෞඛ්‍ය වෛද්‍ය නිළධාරි හෝ පවුල් සෞඛ්‍ය සේවා නිළධාරිනියගේ උපදෙස් පතන්න

හදිසි පෙති ලබා ගැනීමෙන් පසුව වුවද, අන්තඃ ගර්භාෂ තැන්පතුව භාවිතා කළ හැකිය

### වැඩිදුර උපදෙස් සඳහා හමුවන්න

- සෞඛ්‍ය වෛද්‍ය නිළධාරීන්
- වෛද්‍ය නිළධාරීන්
- ලියාපදිංචි වෛද්‍ය නිළධාරීන්
- මහජන සෞඛ්‍ය හෙද සොහොයුරියන්
- පවුල් සෞඛ්‍ය සේවා නිළධාරිනියන්

**සුවසැරිය ✆ 1999**

**සෞඛ්‍ය අමාත්‍යාංශයේ, පවුල් සෞඛ්‍ය කාර්යාංශයේ සහ සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශයේ ප්‍රකාශනයකි**

# අනපේක්ෂිත ලිංගික ඇසුරක් සිදු වුවහොත් .....



## හදිසි පවුල් සැලසුම් ක්‍රම

පසු සංවාස (හදිසි) පෙති

අන්තඃ ගර්භාෂ තැන්පතුව

**බලාපොරොත්තු නොවූ ලිංගික එක්වීමකින් පසුව කාන්තාවකට ඇති වන්නේ අනවශ්‍ය ගැබ් ගැනීමක් ගැන බියකි.**

**ඒ සඳහා ඔබට විසඳුම් 2 ක් ඇත**

- පසු සංවාස (හදිසි) පෙති ගැනීම
- අන්තඃ ගර්භාෂ තැන්පතුව

## හදිසි පෙති යනු මොනවාද?



- බලාපොරොත්තු නොවූ ලිංගික ඇසුරකින් පසු ගැබ් ගැනීමක් වළක්වා ගැනීමට ගත හැකි පෙති වර්ගයකි
- මෙම පෙති වල අඩංගු වන්නේ ප්‍රොජෙස්ටරෝන් හෝමෝනයට සමාන සංයෝගයකි
- මෙය මි.ග්‍රෑ. 0.75 පෙති දෙකක් ලෙස හෝ මි.ග්‍රෑ. 1.5 ක තනි පෙත්තක් ලෙස ලබා ගත හැකිය

## හදිසි පෙති/පෙත්ත සුදුසු කාහට ද?

- කිසිදු පවුල් සැලසුම් ක්‍රමයක් භාවිතා නොකර ලිංගිකව එක්වූ අවස්ථාවක දී
- ලිංගික එක්වීමකදී රබර් කොපු (කොන්ඩම්) ඉරීයාම, ගැලවී යාම හෝ නිවැරදි ලෙස භාවිතා නොකිරීම වැනි අවස්ථා වලදී
- ස්ත්‍රී දූෂණයක් සිදුවූ අවස්ථාවකදී

## ක්‍රියාකාරීත්වය

- ඩිම්බ පිටවීම වැළැක්වීම මඟින් ගැබ් ගැනීම වළක්වයි

## හදිසි පෙති භාවිතා කළ යුත්තේ කෙසේද?

- බලාපොරොත්තු නොවූ ලිංගික එක්වීමකින් පසු හැකි ඉක්මනින් මෙය ගත යුතුය. දින 5 කට පසු මෙම ක්‍රමය සාර්ථක නොවේ
- මෙම පෙති හැකි ඉක්මනින් ගැනීමෙන් සාර්ථකත්වය වැඩිකර ගත හැකිය

මෙම පෙති ගැනීමෙන් පැය 2 ක් ඇතුළත දී වමනය ඇති වුවහොත් හැකි ඉක්මනින් ඒ වෙනුවට අලුතින් පෙති ගැනීම අත්‍යවශ්‍යය. (පැකට්ටුවේ පෙති 2 ක් තිබේ නම් නැවත පෙති 2 ම ලබා ගත යුතුය)

## සාර්ථකත්වය

- සාර්ථකත්වය සාමාන්‍යයෙන් 99% ක් පමණ දක්වා වේ

මෙම පෙති නිතර නිතර භාවිතා නොකළ යුතුය

නිතර භාවිතා කිරීමට සිදුවේ නම් නිසි පවුල් සැලසුම් ක්‍රමයකට යොමුවන්න

## අතුරු ආබාධ

පහත දැක්වෙන ප්‍රධාන අතුරු ආබාධ ඇතිවිය හැකිය. ඒවා අනතුරුදායක නොවන අතර දින කිහිපයකින් මඟ හැරී යනු ඇත.

- ඔක්කාරය
- හිසරදය
- ක්ලාන්තය
- පියයුරු වල වේදනාව
- මාසික ඔසප් චක්‍රයේ අක්‍රමිකතාවයක්

**මෙම පෙති සාමාන්‍ය (නිතිපතා) පවුල් සැලසුම් ක්‍රමයක් ලෙස භාවිතා කිරීම කිසිසේත්ම සුදුසු නොවේ**